# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1903/63 - 2015 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා - 2015.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xii).

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, කබීර් හෂීම් වන මා විසින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, 2011 පෙබරවාරි මස 01 දින අංක 1691/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත 1995 නොවැම්බර් මස 07 වන දින අංක 896/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්ව විද්‍යාලයට අදාල එකී පනතේ 21 වන වගන්තිය යටතේ වූ උපලේඛනයේ I වන තීරයේ සහ එහි II වන තීරයේ අනුමත සටහනේ සඳහන් වන "සමාජීය විද්‍යා හා භාෂා පීඨය" යන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| *"I වන තීරය* | *II වන තීරය* |
| --- | --- |
| *පීඨය* | *අධ්‍යයන අංශය* |
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | 1. සමාජීය විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. භාෂා අධ්‍යයන අංශය |
| | 3. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය |
| | 4. ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය |
| | 5. භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයන අංශය". |

කබීර් හෂීම්,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2015ක් වූ ජනවාරි මස 30 වැනි දින,
කොළඹ දී ය.

03 - 432

1A - PG 2383 — 505 (2015/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.